# 2.15 උඩරට නීතියෙන් නිර්ණය කරන ලද උඩරට කාන්තාවගේ 4.15 ආර්ථික හා සමාජ භූමිකාව

ඩිල්මා තුෂාරි කොග්ගලගේ
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRAT

1980 දශකය තුළ මෙරට සමාජීය විද්‍යා විෂයය ක්ෂෙත්‍රයට අයත් විවිධ පර්යේෂණ හා අධ්‍යයන සඳහා කාන්තා අධ්‍යයන ක්‍රමවේදය භාවිත කිරීම බහුල වශයෙන් සිදුවිය. සෙසු ක්ෂෙත්‍ර හා සාපේක්ෂව බලන කළ ඉතිහාස අධ්‍යයනයේදී එය භාවිතා කිරීම මඳක් පමාවී සිදු වූ බව කිව හැකිය. ඉතිහාස ක්ෂෙත්‍රය තුළ කාන්තා අධ්‍යයනය භාවිතයේ පුරෝගාමීන් වශයෙන් මහාචාර්ය සිරිමා කිරිබමුණේ, මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ, මහාචාර්ය ටී.පී. මෙත්තානන්ද, මහාචාර්ය නීරා වික්‍රමසිංහ සහ ආචාර්ය ජානකී ජයවර්ධන ආදීන් දැක්විය හැකිය. මෙම පර්යේෂණ පත්‍රිකාව දර්ශනපති උපාධිය සඳහා ඉතිහාස විෂයය හා සම්බන්ධ අධ්‍යයනයකදී කාන්තා අධ්‍යයන ක්‍රමවේදය භාවිතකොට කරන ලද අධ්‍යයනයක ප්‍රතිඵලයකි.

පොදුවේ ගත් කළ උඩරට කාන්තාවගේ සමාජ, හා ආර්ථික භූමිකාව පිළිබඳව කරන ලද පුරෝගාමී අධ්‍යයනයන් ගණනාවක් ඇත. (උදා: මෙත්තානන්ද, 1990 සහ 1994 / කපිල විමලධර්ම, 2003) එහෙත් උඩරට නීතිය හා උඩරට කාන්තාව විශේෂකොට ගත් අධ්‍යයනයක අවශ්‍යතාව තවදුරටත් පැවතුණි. ඉහත සඳහන් අධ්‍යයනය තුළ උඩරට නීතිය කෙරෙහි අවධානය යොමු කරනු ලැබ ඇත්තේ සමස්ත අධ්‍යයනයේ කොටසක් වශයෙනි. මෙම අධ්‍යයනය මූලික වශයෙන් අවධානය යොමු කරන ලද්දේ, උඩරට නීතිය විසින් නිර්ණය කොට උඩරට කාන්තාවට නෛතික පුද්ගලයෙකු වශයෙන් ලබාදී තිබූ ආර්ථික හා සමාජ භූමිකාව පිළිබඳවය. මෙබඳු අධ්‍යයනයක විශේෂ වැදගත්කම වනුයේ, සාම්ප්‍රදායක නීතියෙන් නිර්ණය කළ කාන්තාවගේ භූමිකාව තුළින්, අදාළ සමාජය විසින් පරමාදර්ශ හා න්‍යායික වශයෙන් කාන්තාව පිළිබඳව දරණ ලද ආකල්පය හා එතුළින් ඇයට හිමිකර දී තිබූ තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිවීමයි.

මෙම අධ්‍යයනයේදී, විශේෂයෙන්ම 1990 දශකයෙන් පසුව කාන්තා අධ්‍යයන ක්ෂෙත්‍රයේ හටගත් නව ප්‍රවණතා අනුව යමින්, කාන්තාවගේ භූමිකාව තත් සමාජයේ පුරුෂයාට සාපේක්ෂව සලකාබැලීම වෙනුවට එය ආර්ථික හා සමාජ යන දෙඅංශයට බලපෑමක් කළ හැකි ස්වාධීන බලකාරකයක් වශයෙන් සලකා (දේසායි සහ තකාර්, 2003) භාවිත කරන ලද බව අවධාරණය කළ යුතුය.

මෙහිදී පර්යේෂණ ගැටලුව වශයෙන් 'උඩරට නීතිය විසින් නිර්ණය කර තිබූ, උඩරට කාන්තාවට විශේෂිත වූ ආර්ථික හා සමාජ භූමිකාවක් වීද?' යන්න යොදා ගන්නා ලද අතර උපකල්පනය වූයේ නීතිය විසින් නිර්ණය කරන ලද පැහැදිලි ආර්ථික හා සමාජ භූමිකාවක් ඇයට පැවති බවයි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මත පදනම් වූ මෙම අධ්‍යයනය සඳහා විෂයය ක්ෂෙත්‍රය වශයෙන් 17 හා 18 වන සියවස්වල ක්‍රියාත්මක වූ උඩරට සාම්ප්‍රදායික චාරිත්‍රමය නීතිය හා එය බලපැවැත්වූ භූගෝලීය සීමාව තුළ පැවති ආර්ථික හා සමාජ ව්‍යුහය භාවිත කෙරිණි.

මෙහිදී එළඹුණු නිගමනය නම්, පූර්ව-නූතන සමාජයක් වශයෙන් අර්ථ දැක්විය හැකි 17 හා 18 සියවස්වල උඩරට සමාජය තුළ ආර්ථිකයේ මූලික කොන්දේසියක් වූ ඉඩම යන්න හා සමාජ සැකැස්මේ මූලික කොන්දේසියක් වූ පවුල යන්න ආරක්ෂා කරගැනීමෙහිලා කාන්තාවට නීතියෙන් නිර්ණය කරන ලද වගකීම් සම්භාරයක් පැවති බවයි. එසේම, එම වගකීම් හා සමගාමී වූ අයිතිවාසිකම් ප්‍රමාණයක්ද නීතිය විසින්ම ඇයට ලබාදී තිබිණි. මේ වගකීම් හා අයිතිවාසිකම්, උඩරට නීතිය විසින් විධිමත් කරන ලද්දා වූ, ඇය හා සමාජය අතර අප්‍රකාශිත ගිවිසුමක ස්වරූපයෙන් පැවති බව නිගමනය කළ හැකිවිය.